*තෙරුවන් සරණයි!*

# *<u>මූලික පටිච්චසමුප්පාද දේශනාවකට උපකාරක වන දහම් කරුණු පෙළගැස්වීමකි.</u>*

*1 ජීවත්වීම කියන විද්‍යාමාන අත්දැකීම අපිට දැනෙන්නේ කොහොමද?*
*නානා විධ වූ සිතිවිලි, හැඟීම් වලින් තමයි අපට ජීවත්වීම කියන ධර්මතාවය (කාරණා) දැනෙන්නේ වැටහෙන්නේ.*

*උදාහරණ - ආදරය ,කරුණාව, මෛත්‍රිය, සුඛ වේදනාව*
*ද්වේශය, ලෝභය , වෛරය, දුක්ඛ වේදනාව,ඊර්ෂ්‍යාව,කම්මැලිකම*

*ඉහත ආකාරයේ සිතුවිලි, හැඟීම් කොපමණ තිබුණත් ඵලයක් නෑ. <u>දැනෙන්නේ නැත්නම්</u> , <u>දැන ගන්නේ නැත්නම්</u>. මෙම සිතිවිලි, හැඟීම් දැන ගැනීම කියන කාරණය සත්ව විෂය සඳහා පොදු වූ ධර්මතාවයක් බව සාමාන්‍ය දැනුමට අවබෝධ වන දෙයක්. සිතුවිලි හැඟීම් භාෂාවකින් තොරව ඇසුරු කළ හැකි ධර්මතාවයක්. දියුණු සත්වයන් සිතිවිලි, හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා භාෂාවක් භාවිත කරනවා. භාෂාවත් හැඟීමත් කියන්නේ අහසට පොලව තරම් වෙනස් කාරණා දෙකක්.*

*2.අප දන්නා ආකාරයට දැනගැනීම හා සිතිවිලි/හැඟීම් අතර වෙනස කුමක්ද?*
*කෙනෙකුට නිදිය ගත්විට, සිහිසුන් වී සිටින විට, හැඟීම් සිතිවිලි ප්‍රකාශනය ඉතා දුර්වලයි. ජීවමාන භාවය සම්පූර්ණයෙන්ම නැති වෙලා නෑ. එක්තරා අප්‍රකට දැන ගැනීමක් තිබෙනවා. ජීවමාන භාවය ඉතා ප්‍රකට වන්නේ සිතිවිලි හැඟීම් දැන ගැනීම තුළින්. එසේ නම් ජීවමාන භාවයත්, සිතිවිලි /හැඟීම් කියන්නෙත් ධර්මතා දෙකක් බව පැහැදිලියි.*
*ඉහත කාරණා දෙක පිළිබඳ. තුන් කාලයේම ගැඹුරුම පරමාර්ථ විග්‍රහ ඉදිරිපත් කරන්නේ අපගේ සර්වඥයන් වහන්සේයි. එම විග්‍රහය වෙනස් නොවන සදාතනික විග්‍රහයක්. අපි එම උත්තරීතර දේශනාවට අනුව ඉහත දැක්වූ දැනගැනීම හා සිතුවිලි/ හැඟීම් නැමති ක්‍රියාවලිය පිළිබඳ අවබෝධ කරගනිමු.*

*3. සර්වඥයන් වහන්සේගේ දේශනාව අනුව දැනගැනීම හා සිතිවිලි/හැඟීම් අතර වෙනස කුමක්ද?*

| | | |
|---|---|---|
| *දැනගැනීම* | *විඤ්ඤාණය, සිත, චිත්තය, මනස - 01* | *නාම ස්කන්ධ* |
| *සිතිවිලි /හැඟීම්* | *චෛතසික (සිත සමග උපදින වෙනත් ක්‍රියා)- 52* | |

*සර්වඥයන් වහන්සේගේ දේශනාව අනුව චිත්තය හා චෛතසික සම්ප්‍රයුක්ත ක්‍රියාවලියක්. සම්ප්‍රයුක්තයි කියන්නේ වෙන්කළ නොහැකි බවයි. චිත්තය හා චෛතසික එකටම පෙර පසු නොවීම, එකම භූමියේ උපදින ධර්මතා.*
*මූලික වශයෙන් චෛතසික ආකාර තුනක් තියෙනවා*

*1 කුසල චෛතසික ( පුණ්‍ය හැඟීම් ) 25*
*11 අකුසල චෛතසික (අපුණ්‍ය හැඟීම් ) 14*
*111 අන්‍යසමාන චෛතසික 13*

*චෛතසික සම්ප්‍රයුක්ත නය ක්‍රමය*

| | |
|---|---|
| *සිත+අන්‍යසමාන චෛතසික+කුසල චෛතසික - 21* | *චිත්තෝත්පාදයන් (89)* |
| *සිත+අන්‍යසමාන චෛතසික+අකුසල චෛතසික - 12* | |

*4. චිත්ත චෛතසික හට ගන්නේ කොහේද? කොපමණ ආයුෂයක් තිබෙනවාද?*

*චිත්තෝත්පාද හටගන්නේ, උපදින්නේ ඇස,කණ, නාසය, දිව, කය ආදී ප්‍රසාද භූමි (සළායතන) හෙවත් අජ්ජත්තික රූප ඇසුරු කරගෙනයි. රූප (වර්ණ), ශබ්ද ,ගන්ධ,රස, පොට්ඨබ්බ ආදී ධර්මතා හෙවත් බාහිර රූප ප්‍රධානව උපකාර වෙනවා මෙම චිත්තෝත්පාද හට ගැනීම සඳහා, ප්‍රත්‍ය සපයන මෙම ධර්මතා රූප ලෙස(28) හඳුන්වනවා.*

*එසේනම් ජීවත්වීම කියලා කියන්නේ නාම හා රූප ධර්මතා දෙකක පහළවීමක් හට ගැනීමක්. මෙම නාමරූප වලට තිබෙන්නේ ඉතාමත්ම කෙටි/කුඩා ආයුෂයක්.වහා ඉපදිලා වහා නැතිවන සුළු ධර්මතාවන්. ධර්ම නියාමයන්ට අනුකූලවයි මෙම නාමරූප ධර්මතා හටගන්නේ.ප්‍රසාද භූමි (සළායතන) ඇසුරුකරගෙන මුළු ශරීරයේම චිත්තෝත්පාද හට ගන්න පුළුවන් වුනත් එක මොහොතක පහළවන්නේ එක ස්ථානයකම පමණයි. එම පහළ වූ ධර්මතාවය (නාම රූප) නැති වෙලාමයි තව තැනක උපදින්නේ.*

*5.සත්ව ශරීරයක චිත්තෝත්පාද උපදින ආකාරය*

*රූප (වර්ණ) + ඇස (චක්ඛු ප්‍රසාද)--------- චක්ඛු විඤ්ඤාණ 2*
*ශබ්ද + සෝත (සෝත ප්‍රසාද) --------- සෝත විඤ්ඤාණ 2*
*ගන්ධ + ඝාණ (ඝාණ ප්‍රසාද) ----------ඝාණ විඤ්ඤාණ 2*
*රස + ජිව්හා (ජිව්හා ප්‍රසාද) ----------ජිව්හා විඤ්ඤාණ 2*
*පොට්ඨබ්බ + කය (කාය ප්‍රසාද) ----------කාය විඤ්ඤාණ 2*
*ධම්ම + මන ----------මනෝ විඤ්ඤාණ 79*

*චිත්තෝත්පාදයන් (89)* (චිත්ත+ චෛතසික)

*මේ ආකාරයට චිත්තෝත්පාදයක් කියන්නේ ධර්මතා සමූහයක් (ස්කන්ධ) සම්ප්‍රයුක්තව (වෙන්නොකළහැකි ආකාරයට) පහළවීමයි. පංචස්කන්ධයක් පහළ වෙනවා කියන්නේත් චිත්තෝත්පාදයක් පහලවීමමයි.*

*රූප (රූපස්කන්ධය) —-- ප්‍රසාද රූප ප්‍රමුඛ රූපයෝ / ආරම්මණ රූප (රූප 28)*
*වේදනා (වේදනාස්කන්ධය) —-- චෛතසික 52/1*
*සංඥා (සංඥාස්කන්ධය)------ චෛතසික 52/1*
*සංඛාර (සංඛාරස්කන්ධය) —-- චෛතසික 52/වේදනා, සංඥා හැර ඒ මොහොතේ චිත්තෝත්පාදයේ යෙදෙන සියළු චෛතසික*
*විඤ්ඤාණ (විඤ්ඤාණස්කන්ධය)------- විඤ්ඤාණ(89/1)*

*6. පංචස්කන්ධය හා පංචඋපාදානස්කන්ධය*

*පංචස්කන්ධය බොහෝ සෙයින් හේතු වී පංචඋපාදානස්කන්ධයක් සමුදය වන බව පෙනේ. පංචස්කන්ධය ඡන්ද රාගයෙන් බැඳුනු කල පංචඋපාදානස්කන්ධය උපදී.*

*පංචස්කන්ධය—--------- ප්‍රසාද රූප (ප්‍රකටයි)+වේදනා+සංඥා+සංඛාර+විඤ්ඤාණ*
*පංචඋපාදානස්කන්ධය—---අරමුණු රූපය (රුප්පනය)+වේදනා+සංඥා+සංඛාර+විඤ්ඤාණ*

*නවඋපත/ ප්‍රතිසංධිය යනු පංචස්කන්ධයක් ලෙස සිතන්න. අරමුණකට ඡන්දරාගයෙන් බැඳීම යනු පංච උපාදානස්කන්ධයක් හටගැනීමකි.*
*වැදගත්—- පටිච්චසමුප්පාද දේශනාවකදී පංචස්කන්ධයක් ක්‍රමිකව පංචඋපාදානස්කන්ධයක් බවට පත්වන ආකාරය විද්‍යාමාන වේ. (සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා)*

*ස්කන්ධ දේශනාවකදී —-- රූප (රුප්පනය)+වේදනා+සංඥා+සංඛාර+විඤ්ඤාණ සෘජුව පංච උපාදානස්කන්ධයක සමුදයක් ගැන දේශනා කරයි.*


*ඉහත කාරණා සම්පිණ්ඩනය කළහොත් ජීවත්වීම යනු පංචස්කන්ධයන් පංච උපාදානස්කන්ධයන් හට ගැනීමකි, පහළවීමකි, සමුදය වීමකි. සර්වඥයන් වහන්සේ දුක ලෙස වදාරා තිබෙන්නේ ස්කන්ධයන්ගේ පහළවීමයි. ස්කන්ධයන්ගේ පහළවීම අහේතුකව හෝ කාගේ හෝ බලපෑමකින් සිදුවන්නක් නොව, ඒ ඒ ස්කන්ධයාගේ ප්‍රත්‍ය ශක්තියෙන්ම සිදුවන්නකි. ඒ ඒ ස්කන්ධයන්ගේ, පරමාර්ථයන්ගේ (නාම රූප) ප්‍රත්‍ය ශක්තිය අනෙකාට ලබා දී ම අනෙකාගේ ප්‍රත්‍ය ශක්තිය ඒ ඒ ස්කන්ධයන් ලබාගෙන සාමූහික ප්‍රත්‍යයෙන් උපදින ධර්මතාවයෝය. මෙම ක්‍රියාවලියේ ප්‍රධාන කොටස් දෙකකි. ඒවා නම් හේතු සහ ඵලයන්ය. හේතු යනු ප්‍රත්‍ය ශක්තියයි ,ඵලය යනු උපදින යමක් ඇද්ද එයයි.*

*අද දින මාතෘකාව වන පටිච්චසමුප්පාදය නමැති පැනවීමේ තේරුම වන්නේ ප්‍රත්‍ය ශක්තිය ලබාදී, යම් ධර්මතාවයක් බිහි කළ හැකි ධර්මය, පටිච්චසමුප්පාද ධර්මයකි. දුකක සම්භවය සිදුවන විට පටිච්චසමුප්පාද අංග දොළහකින් (12) සර්ව සංග්‍රහික දේශනාවක් ලෙස සර්වඥයන් වහන්සේ දේශනාව කරන ලදි. අංග දොළහට ඇතුලත් වනුයේ ඉහත කියන ලද නාම පනස් තුන ( චිත්ත 1+ චෛතසික 52) හා රූප විසි අටයි.*

*අංග 12*

*අවිද්‍යා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතනය, ඵස්ස, වේදනා,තණ්හා, උපාදාන, භව, ජාති, ජරාමරණ*


*7. ජීවත් වීම යනු ගැඹුරින් සලකා බැලීමේදී මරණයද, උපතද, ජීවත්වීමද, නැවත මරණය හා නැවත ඉපදීම පංචස්කන්ධයාගේම සමුදයවීමකි, හටගැනීමකි. මෙම සත්ත්වයාගේ සසර නැමැති පැවැත්ම පංචස්කන්ධයාගේ සමුදයක් බව සත්‍යයකි. හේතුඵල දහමට අනුකූලව පංචස්කන්ධයාගේ සමුදය, හටගැනීම, දුක්ඛ සම්භවයක් ලෙස සර්වඥයන් වහන්සේ දේශනා කරන ලදී. සතෙක් - පුද්ගලයෙක් සසර ගමනේ සැරිසරන ධර්මතාව සර්වඥයන් වහන්සේ පෙන්වා දී තිබෙන්නේ දුකක සම්භවයක්, සමුදයක් ,ඉපදීමක් ලෙසයි.*




********

*චිත්තෝත්පාදයක් හෙවත් පංචස්කන්ධයක් හට ගැනීමේදී, ස්කන්ධයෝ හෙවත් නාමරූප ධර්මතා එකිනෙකට ප්‍රත්‍යවීමෙන් ප්‍රත්‍යෝත්පන්න (හටගත්) වූ ඒ ඒ ධර්මතා පහළ වී නිරුද්ධ වෙනවාත් සමඟ නැවත පංචස්කන්ධයක් ඉපදීමට අවශ්‍ය ප්‍රත්‍ය ශක්තීන් ඊළඟ චිත්තෝත්පාදයට ලබා දීම සිදුවේ. මේ ආකාරයට පටිච්චසමුප්පාදය එක සිතක හා සිත් අතර ලෙස ආකාර දෙකකින් සිදුවන බව පැහැදිලි වේ. එක සිතක සිදුවන පටිච්චසමුප්පාදය හෙවත් ඒකචිත්තක්ෂණික පටිච්චසමුප්පාදය හා සිත් අතර සිදුවන පටිච්චසමුප්පාදය හෙවත් නානා චිත්ත පටිච්චසමුප්පාදයයි. සූත්‍ර පිටක දේශනාවන්හි පෙන්වා දෙන්නේ නානාචිත්ත පටිච්චසමුප්පාද ක්‍රමයයි.*

*8.ඉහත ගැඹුරු හේතුඵල දහම හෙවත් පටිච්චසමුප්පාදය තේරුම් ගැනීම උදෙසා පහත දක්වන උපමාව යොදා ගන්න.*

| *ගසක පැවැත්ම* | *දුකක සම්භවය ( සත්ව පැවැත්ම)* |
|---|---|
| <br>*<u>ප්‍රධාන හේතු</u>*<br>*බීජය*<br>*පස*<br>*ජලය*<br>*වාතය*<br>*ආලෝකය*<br>*පොහොර .....*<br>*<u>අප්‍රධාන හේතු</u>*<br>*ඍතුව*<br>*ගුරුත්වය*<br>*<u>සොයානොගත් හේතු</u>*<br>*<u>....</u>*<br>*<u>....</u>* | <br>*<u>ප්‍රධාන හේතු (අංග 12)</u>*<br>*අවිද්‍යා*<br>*සංඛාර*<br>*විඤ්ඤාණ*<br>*නාමරූප*<br>*සළායතන*<br>*ඵස්ස*<br>*වේදනා*<br>*තණ්හා*<br>*උපාදාන*<br>*භව*<br>*ජාති*<br>*ජරාමරණ*<br><br>*<u>අප්‍රධාන හේතු</u>*<br>*<u>....</u>*<br>*<u>සොයානොගත් හේතු නැත</u>*<br>*<u>පරිපූර්ණ දේශනාවකි.</u>* |

*අපගේ ජීවිත අත්දැකීම් අනුව, ගසක් නොසිඳ පරම්පරාවක් ලෙස පැවැත්වීම පිළිබඳ යම් අදහසක්, දැනුමක් අපට ඇත. අපිට ප්‍රකටව දැනෙන්නේ ප්‍රධාන හේතු නිසා ගසෙහි පැවැත්ම හට ගන්නා බවයි. නමුත් අප්‍රකට හේතුද, නොදන්නා හේතුද ඇති බව වැටහේ. ප්‍රධාන හේතුන් නොසිඳ පවතින තාක් කල් ගසෙහි පැවැත්ම සිදුවේ. එම හේතු වෙනස් කරන කල්හි ගසෙහි පැවැත්මට බාධා පැමිණෙන බව පැහැදිලිව වටහාගන්නට පුළුවන්. සම්පූර්ණයෙන්ම ගස මරා විනාශ කර දැමීමට නම් ප්‍රධාන හේතුවක් පමණක් සම්පූර්ණයෙන්ම ලබා නොදීමෙන් කළ හැකි බවට අවබෝධ කළ හැක. නමුත් අප්‍රධාන හේතු කොතෙක් වෙනස් කළද, සම්පූර්ණයෙන්ම ගස විනාශ කළ නොහැකි බව වැටහේ.*

ප්‍රධාන එක් ඉහේතුවක් පමණක් සපයා නොසිටීමෙන් ක්‍රමිකව ගහ සම්පූර්ණයෙන්ම විනාශවන බව සත්‍යයකි.

වෙන වෙනම හේතු වශයෙන් යෙදී, ගස නැමති ඵලය විද්‍යාමාන වුව ද, එම ඵලය හේතුවලින් වෙනස් වූවකි. ගසකින් නැවත වෙන වෙනමම එම හේතුන් වෙන් කළ නොහැක. හේතු සම්භූතයෙන් ම ඵලය ගොඩනැගේ. හේතු එකකි ඵලය තවත් එකකි. හේතු විද්‍යාමාන නොවේ නම් ඵලයද විද්‍යාමාන නොවේ. හේතු නැති කළහොත් ඵලය ද නැති වෙයි. මේ ආකාරයේ නුවණක් අපට මෙම උදාහරණයෙන් ගත හැකි.

මෙම ගස නමැති ඵලය විද්‍යාමාන කරන්නා වූ හේතු ගැන සලකා බලන කල්හි, එම එකිනෙක ආවේණික හේතුන්ද, වෙනත් හේතුන්ගේ ඵලයක් බව දැනගත යුතුය. එබැවින් හේතුවත් ඵලයත් සංකල්පිතයක් (සිතේ උපදවා ගත්) ලෙස වෙන් කළ හැකි වුවත් එහි ප්‍රයෝගික භාවයක් නැත. හේතුවත් ඵලයත් වෙන්කළ නොහැක්කකි. <u>හේතුඵල ක්‍රියාවන්</u> මඟින් ගසේ පැවැත්ම සිදුවන බව අවබෝධ කළ යුත්තකි.

මේසේ ගසේ පැවැත්ම සිදුවන කල්හි අනාගතය සඳහා බීජ නිෂ්පාදනය ක්‍රමිකව සිදුවේ. ගස පවත්වන හේතුන්ගෙන්ම බීජ නමැති ඵලයද හට ගනියි.බීජය ගැන කතා කරන විට බීජයේ පැලවීමේ ගුණය ඉතාමත්ම සියුම් ධර්මතාවයකි. ගසේ සම්මත පැවැත්ම තිබියදී බීජයේ පැළවන ගුණය පමණක්ම විනාශ කළ හැකි බව විද්‍යා විෂය මගින් තහවුරු වේ. බීජයේ භෞතිකත්වය එසේම තිබියදී පැලවන ගුණය පමණක් විනාශ කළ හැකි බව සත්‍යයකි. ගසට අදාල හේතුඵල ක්‍රියාවලිය ඉතාමත්ම සංකීර්ණ ක්‍රියාවලියක් බව හැගේ.බීජයට අදාළව පවතින හේතුඵල ක්‍රියාව, ඉතා සියුම්ව අවබෝධ කරගැනීමෙන්, බීජයේ සියුම් පැළවන ගුණය් විනාශ කළ හැකි බව සත්‍යයකි. එමගින් ගහේ පැවැත්ම නතර කළහැකි බව පිළිගත හැක.

මෙසේ මෝරන ලද ගසක, බීජ හට ගන්නා ආකාරය මෙන්, සත්වත්වය හෙවත් සළායතන මෝරා බාහිර අරමුණු ගන්නා කල්හි අවිද්‍යා, තණ්හා, දෘෂ්ටි ආදී සියුම් ධර්මතා හේතුවීම තුළින් **<u>භවය</u>** නැමැති ඵලයක් සාදයි. **භව** හේතුවෙන් නැවත උපදී. භව නිරෝධ කළහොත් සත්වත්වය හෙවත් සලායතන සමුදය නතර වී දුක නිරෝධවේ.

ගසක බීජයේ පැලවෙන ගුණය ඉතාමත් සියුම් වන්නා සේ, භවය නැමැති ඵලයට සියුම් හේතු වනුයේ අවිද්‍යා, තණ්හා , දෘෂ්ටි ආදී ධර්මතාවෝය. අවිද්‍යා, තණ්හා , දෘෂ්ටි ආදී සියුම් ධර්මතාවයෝ නිරෝධ කළ පසු (නොහට ගන්නා විට) චිත්තසන්තානයේ චේතනා ශක්තියක් (කර්ම) ඉපදුනද, නැවත උපතක් ලබාදෙන ශක්තියක් ඒවායේ නැත. හුදු ක්‍රියා ධර්මයක් පමණකි. ඒවා ක්‍රියා සිත් නම් වේ.


ඉහත විස්තරය අනුව ගසක පැවැත්ම ඉතාමත් සංකීර්ණ විෂයක් වුවද ක්‍රමික අවබෝධය තුළින්, හේතු නැති කිරීම හෙවත් සපයා නොසිටීමෙන් ගසක පැවැත්ම සුදුසු අයුරින් වෙනස් කළ හැකි බව විද්‍යාමාන සත්‍යයකි .

මේ ආකාරයට සර්වඥයන් වහන්සේ දුකක සම්භවය, පැවැත්ම පිළිබඳ ප්‍රධාන අංග දොළහකින් දේශනා කර ඇති අතර එම අංගයන් ක්‍රමිකව දුබල කරමින් සම්පූර්ණයෙන්ම හේතු ලබා නොදුනහොත්, දුකක සම්භවය නිරෝධ කළ හැකි බව දේශනා කර ඇත.


එක් ප්‍රධාන හේතුවක් ඉවත් කළහොත් ක්‍රමිකව ගස විනාශ වන්නා සේ, පටිච්චසමුප්පාද අංග 12 න් එකක් නිරෝධ කළහොත් අනෙක් සියලුම අංග නිරෝධ වන බව ආර්ය සත්‍යයකි.

හේතුඵල දහම හෙවත් පටිච්චසමුප්පාදය පිළිබඳ අවබෝධය යනු, හේතුවත් ඵලයත් වෙන්කළ නොහැකි සේ එහි ක්‍රියාව අවබෝධයයි. ක්‍රියාවේ පච්චුප්පන්නභාවය අවබෝධයත් සමඟ හේතුඵල දහම/පටිච්චසමුප්පාදය අකාලික ධර්මතාවයක් බව අවබෝධ වේ. අකාලිකත්වය තුළින් සියලු ප්‍රඥප්තින් - මානයන් නිරෝධ වී (හටනොගෙන) නැවත ඉපදීමකට හේතු සියල්ලම නිරෝධ වේ. නිවන යනු මෙයයි නිරෝධයයි .

## දුක්ඛ සම්භවය අතීත වර්තමාන අනාගත ක්‍රමය - ලෞකිකයි නානාචිත්ත ආකාර




## දුක්ඛ සම්භවය පච්චුප්පන්න - ලෝකෝත්තර මාර්ගයෙහි -ඒකචිත්තක්ෂණික ආකාර




***තෙරුවන් සරණයි!***